Department of Education Sabaragamuwa province' Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය - 08

විෂය - නර්තනය

ශ්‍රේණිය - 07

prepared by- බළංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

# ශිල්පීය ප්‍රාගුණය එළිදක්වන අවස්ථා

- ශිල්පීය ප්‍රාගුණ්‍ය අවස්ථාව යනු ශිල්පියෙකු විසින් තම සාම්ප්‍රදායික නර්තනයේ මූලික හරඹ හා පද කොටස් අභ්‍යාස කිරීමෙන් පසුව තම දක්ෂතාවයන් පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කිරීමයි.

උඩරට - වෙස් පළැඳවීම

පහතරට - මඩු බැසීම

සබරගමු - ගුරු වරම් දීම

## වෙස් පළැඳවීම මංගල්‍යය



## හිස වෙස් පැලඳවීමේ මංගල්‍යයේදී සිදුකරනු ලබන චාරිත්‍ර විධි

- ආධුනික නර්තන ශිල්පියා මාසයක් හෝ සතියක කාලයක් නිර්මාංශව සිටිය යුතුය.
- එම කාලය තුළ ආගමික වතාවත්වල නිරත විය යුතුය.
- ආධුනික නර්තන ශිල්පියාගේ හඳහනට අනුව සිස වෙස් තැබීමට සුබ මොහොතක් සාදා ගත යුතුය.
- බෞද්ධ ආගමික ස්ථානයක් වෙන්කර ගැනීම.
- තෝරාගත් සුබ දිනයේ අලුයම නැකතට නා පිරිසදු වී පැන් කලයක් ගෙන ශිල්පියාගේ මුහුණ සුදු රෙදි කඩකින් ආවරණය කිරීම එදින මුල්ම චාරිත්‍රය වේ.
- ආධුනික ශිල්පියා අඩක් වෙස් ඇඳුමෙන් සැරසීම.
- සුබ මොහොතට පිරිත් සජ්ජායනා මැද හිස වෙස් පැළඳවීම.
- ශිල්පියාගේ මුහුණ සුදු රෙදි කඩකින් වසා ශිල්පියා ඉදිරිපිට පොල් ගෙඩියක් බිඳීම හා කිරි ගසක් පෙන්වීම.
- ආධුනික ශිල්පියාගේ මුහුණ කිරි කොරහකින් පෙන්වීම.
- අලුයම රැගෙන ආ කලය හිස වටා තුන් වරක් කරකවා බිඳ වීදුරු කණ්නාඩියකින් තම මුහුණ බැලීම.
- මෙම චාරිත්‍ර වලින් අනතුරුව මල් යහන ඉදිරිපිට තම දක්ෂතාවයන් ඉදිරිපත් කිරීම .

පැවරුම

01 උඩරට පහතරට සබරගමු ශිල්පීය ප්‍රාගුණ්‍ය එළිදක්වන අවස්ථා මොනවාද?

02 ශිල්පීය ප්‍රාගුණ්‍ය අවස්ථාවන් යනු කුමක්දැයි හඳුන්වන්න.

03 උඩරට නර්තන සම්ප්‍රදායේ ආධුනික ශිල්පියෙකු මේ සඳහා ඉටු කළ යුතු චාරිත්‍ර විධි මොනවාද?

04 අන්තර්ජාලය භාවිතා කරමින් ශිල්පීය ප්‍රාගුණ්‍ය එළි දක්වන අවස්ථාවන් නරඹා රස විඳින්න.

සැකසුම

ඩබ් . සිතාරා පවිත්‍රානි
ර/විද්‍යාකර මහා විද්‍යාලය

ස්නානය කිරීම .



පැන් කළයක් ගැනීම| හිස ආවරණය කිරීම



## පැවරුම

1. අතීතයේදී දවුල භාවිතා කළ ආගමික අවස්ථා දෙකක් ලියන්න.

2. අතීතයේදී සන්නිවේදන කාර්යය සඳහා දවුල යොදාගත් වාදන අවස්ථා 4 ක් ලියන්න.

3. සබරගමු ශාන්තිකර්ම සඳහා යොදා ගන්නා ප්‍රධාන සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩය කුමක්ද?

4. දවුල් ඇස සෑදීමට ගන්නා සම් වර්ග දෙකක් නම් කරන්න.

5. දවුල් වාදනය සඳහා උපකරණයේ/ආධාරකයේ නම කුමක්ද?

සැකසුම:- N.G. රොහාන් සංජීව
ර/බල/මද්දේගම සිරි පියරතන විද්‍යාලය